(නවවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක 1(1).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2023 පෙබරවාරි 15 බදාදා**

## දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා.1/2023

ගරු ලලිත් වර්ණ කුමාර මහතා
ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා
ගරු ඩී. වීරසිංහ මහතා
ගරු ජගත් සමරවික්‍රම මහතා
ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා
ගරු මිලාන් ජයතිලක මහතා
ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය
ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා
ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා
ගරු තිසකුට්ටි ආරච්චි මහතා
ගරු කපිල අතුකෝරල මහතා
ගරු සුදත් මංජුල මහතා
ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු සම්පත් අතුකෝරල මහතා,— පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සහ පාර්ලිමේන්තුවේ වරප්‍රසාද කඩවීමේ සිද්ධි සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාව හා සම්බන්ධ කරුණු විමර්ශනය කර ඒ සඳහා සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

එන්. ජී. පුංචිහේවා මහතා (සභාපති), එස්. බී. දිවාරත්න මහතා, එම්. එම්. මොහොමඩ් මහතා, කේ. පී. පී. පතිරණ මහතා සහ පී. එස්. එම්. චාල්ස් මහත්මිය යන අයගෙන් සැදුම් ලත් මැතිවරණ කොමිෂන් සභාව 2020 දෙසැම්බර් 03 වැනි දින පත් කරන ලද හෙයින් ද;

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ(3) ව්‍යවස්ථාව යටතේ මැතිවරණ කොමිෂන් සභාව පාර්ලිමේන්තුවට වගකිව යුතු හෙයින් ද;

විසි එක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙහි 30(4) ව්‍යවස්ථාව ප්‍රකාරව කොමිෂන් සභාවේ සාමාජිකයන් ධුර දැරීම අවසන් කර අන්තර්කාලීන සාමාජිකයන් ලෙස බලතල සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සිදු කරමින් සිටින හෙයින් ද;

2023 ජනවාරි 18 වැනි දින පළාත් පාලන මැතිවරණය වෙනුවෙන් නාමයෝජනා කැඳවන ලද බව මැතිවරණ කොමිෂන් සභාව විසින් ප්‍රකාශ කරනු ලැබ ඇති හෙයින් ද;

කොමිෂන් සභාවේ සාමාජිකයන් දෙදෙනකු විසින් මෙම ඡන්ද විමසීම 2023 මාර්තු 09 දිනට නියම කිරීමට තීරණය කර අනෙකුත් සාමාජිකයන් තිදෙනාගේ එකඟතාව ලබාගෙන ඇති බව ප්‍රකාශ කරනු ලැබ ඇති හෙයින් ද;

2023 මාර්තු එබඳු මැතිවරණයක් පැවැත්වීම සඳහා අරමුදල් සොයා ගැනීම අභියෝගාත්මක වනු ඇති බව සඳහන් කරමින් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අධිකරණයට දිවුරුම් ප්‍රකාශයක් ගොනු කරනු ලැබ ඇති හෙයින් ද;

එවැනි මැතිවරණයක් පැවැත්වීම සඳහා සපුරාලිය යුතු සියලුම පූර්ව කොන්දේසි සපුරා ඇති බවට කොමිෂන් සභාව සෑහීමට පත් වී තිබේද යන්න පිළිබඳව ප්‍රශ්නයක් ඇති හෙයින් ද;

2023 ජනවාරි 25 වැනි දින කොමිෂන් සභාවේ සාමාජික පී. එස්. එම්. චාල්ස් මහත්මිය විසින් ජනාධිපතිවරයා වෙත සිය ඉල්ලා අස්වීම ඉදිරිපත් කරනු ලැබ ඇති හෙයින් ද;

පළාත් පාලන මැතිවරණය සම්බන්ධයෙන් පැන නැගී ඇති ගැටලු පිළිබඳව කොමිෂන් සභාව රාජ්‍ය මූල්‍ය පිළිබඳ වගකීම දරන පාර්ලිමේන්තුව වෙත වාර්තා කිරීමට අපොහොසත් වී ඇති හෙයින් ද; සහ

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ සහ පාර්ලිමේන්තුවේ වරප්‍රසාද කඩ වී තිබේ නම්, ඒ පිළිබඳව විමර්ශනය කර ඒ සම්බන්ධයෙන් සුදුසු නිර්දේශ ලබා දිය යුතු වන හෙයින් ද;

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ සහ පාර්ලිමේන්තුවේ වරප්‍රසාද කඩවීමේ සිද්ධි සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාව හා සම්බන්ධ කරුණු විමර්ශනය කර ඒ සඳහා සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කර සිටියි.

2. (අ) කථානායකවරයා විසින් කාරක සභාවෙහි සභාපතිවරයා සහ සාමාජික මන්ත්‍රීවරයන් පත් කළ යුතුය; සහ

   (ආ) පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 101 හි විධිවිධාන ප්‍රකාරව කාරක සභාව සාමාජික මන්ත්‍රීවරයන් හත් දෙනෙකුගෙන් (07) සමන්විත විය යුතුය.

3. එම කාරක සභාවට —

   (අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

   (ආ) ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් පුළුල් අධ්‍යයනයක් සිදු කිරීම සඳහා කාරක සභාව විසින් අවශ්‍ය යැයි තීරණය කරනු ලබන පරිදි, ඕනෑම තැනැත්තෙකු එම කාරක සභාව ඉදිරියට කැඳවීමට ද, ඕනෑම ලියවිල්ලක් හෝ වාර්තාවක් ලබා දෙන ලෙසට ඕනෑම තැනැත්තෙකුට නියම කිරීමට ද, එකී සියලු සාක්ෂි, ලිඛිතව හෝ වාචිකව, ලබා ගැනීමට ද;

   (ඇ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට ද; සහ

   (ඈ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද පාර්ලිමේන්තුව කල් තබනු ලැබ හෝ වාරාවසාන කරනු ලැබ තිබුණ ද රැස්වීම් පවත්වාගෙන යාමට ද

බලය තිබිය යුතු ය.

4. කාරක සභාවේ වාර්තාව එහි පළමු රැස්වීමේ දින සිට මාසයක (01) කාලයක් හෝ පාර්ලිමේන්තුව විසින් දීර්ඝ කරනු ලබන එවැනි කාල පරිච්ඡේදයක් ඇතුළත දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.